# විවිධ



සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

# "පැසුණු රන්වන් කරල් - නැමී ස්නේහයෙන් බිමට ---"



පසුගිය දා අන්තර්ජාලයේ ප්‍රදර්ශනය වූ රසවත්, අර්ථවත් හා නිර්මාණාත්මක කෙටි පද්‍යයක් මගේ ඇස ගැසිණ. එම කෙටි පැදියෙහි අරුත තවත් පැහැදිලි කර ලන්නට ඒ හා සමග ඡායාරූපයක් ද ප්‍රදර්ශනය විය. තරුණයකු සමග එහි පෙනී සිටියේ වැඩිහිටි කාන්තාවකි. ඡායාරූපය හා එම සැකෙවි කව සැබවින්ම ගැළපුණේ යයි මට සිතුණි. තමන්ට අකුරු උගැන්වූ ගුරුතුමියක් නොවූවද, තම වැඩිමහල් සොයුරියගේ ගුරුතුමිය වූ එම කාන්තාව හා සමීප ඇසුරක් ලබන්නට අවකාශ ලද ඔහු ඇයගෙන් උගත් දේ, දැනගත් පාඩම්, ලද උපදෙස් බෙහෙවින් අගය කර ඇත. එයින් ලද සතුට, උද්දාමය සමග ඔහු අතින් පහත දැක්වෙන එම නිර්මාණය රචනා වී ඇත.

"පැසුණු රන්වන් කරල් - නැමී ස්නේහයෙන් බිමට
කියයි, මේ විසල් පාඩම - උගත්තේ ඔබෙන් බව"

කවියක හෝ අන් කවර සාහිත්‍ය නිර්මාණයක වුව එහි ඇතුළත් වන පදවලින් මතුපිටින් කියවෙනවාට වඩා පුළුල් අරුතක් ගම්‍ය වීම නිර්මාණ කරුවකුගේ කුසලතාව මැනවින් සනාථ කර ලයි. ශ්‍රී ලාංකික සිංහල සංස්කෘතික පසුබිමෙහි එදා මෙදාතුර පිළිගැනුණ, එමෙන්ම තව දුරටත් ඇගයීමට ලක් වෙමින් පවතින යහ ගුණ අතර නිහතමානී බව විශේෂත්වයක් හිමි කරගනියි. ඇතුළත ගැඹුරක් ඇති, උගත්, බුද්ධිමත්, යහපත් පුද්ගලයන් හැම විටම නිහතමානී වන බව සමාජයෙහි සාමාන්‍ය පිළිගැනීම වෙයි. උගත් කම මෙන්ම උසස් තනතුරු හෙබවීම ද උක්ත යහපත් පුද්ගලයන් ඇතුළතින් මෙන්ම පිටතින් ද තවතවත් නිහතමානී අය බවට පත් කරවනු විනා අනවශ්‍ය උඩඟු බවකින් යුක්ත වීමට මග නොපාදනු ඇත. සිංහල සමාජය තුළ ව්‍යවහාර වන විවිධ ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ, රූඪී ආදියෙන් කියවෙන වැදගත් අදහස් අතර උඩඟු බව වෙනුවට නිහතමානී බව ඇගයීම දක්නට ඇත. "උඩඟු බව විනාශයට මුලයි" යන්න එදා වැඩිහිටියන්ගේ මුව'ග රැව් දුන් කියමනකි. "ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න" යි කෙනකු තවත් කෙනකුට පැවසුවහොත් එයින් අදහස් වන්නේ ද අනවශ්‍ය ලෙස උඩඟු වීමේ අයහපත් බවයි. කිසියම් සතුටුදායක පුවතකින් අතිශය ප්‍රීතියට පත් වෙමින් හැසිරෙන තම දරුවනට මව්පියන්ගෙන් ලැබෙන අවවාදයක් නම්, "වැඩියෙන් හිනා වුණොත් අඬන්නට වේවි" යන්නයි.

ඇතැම් විටෙක යම් දෙයක් නිසා සීමාව ඉක්මවා සතුටු වන කෙනකුට දිය හැකි හොඳම අවවාදයක් නම් අපට හුරු ප්‍රස්තාව පිරුළු අතර ඇති, "උඩ පැන්නොත් බිම වැටේ" යන්නය. මෑතකදී මට අසන්නට ලැබුණ තවත් අගනා අදහසක් ද මෙම 'උඩඟු බව' යන අයහපත් ලක්‍ෂණය ක්‍රියාවට නැංවීම වළක්වා ලන්නකි. එනම්, "ඔබ ඉහළට නැග යන විට ඒ අතරතුර හමු වන අයට සුහද වෙන්න. ඒ මන්ද, ඔබ යළිත් පහළට බසින විට ඒ අයගේ සුහදතාව ඔබට අවශ්‍ය වන නිසයි." මෙහි දැක්වෙන පරිදි ද, තමන් තනතුරකින් ඉහළට යාම හෝ, ධන ධාන්‍ය, වස්තු සම්භාර ආදියෙන් ආඪ්‍ය වීම හෝ කෙසේ වත් අන් අයට අකාරුණික වෙමින් තමා පමණක් එම ගමන යාමෙන් අනාගතයේදී තමන් අසරණ තත්වයකට පත් වූ විට කිසිවකුගේ දයාවක්, කරුණාවක් නොලැබී යාමට හේතු වෙයි. ඒ අනුව උඩඟු බව පුද්ගලයකු සමාජය තුළ ගෞරවයට පාත්‍ර කරවන්නක් නොවේ. තමන් සතුව බලතල තිබීම, මිල මුදල් හා ධන සම්පත් තිබීම අනවශ්‍ය උඩඟුකමකට හේතුවක් කරගත යුතු නොවේ. තමන්ට නැති විට මෙන්ම ඇති විට ද මධ්‍යස්ථ හැසිරීමකින් යුතුව ක්‍රියා කරන්නා සැබවින්ම සමාජයේ ගෞරවාදරයට ලක් වනු ඇත.

පුද්ගලයකු සතු විය යුතු මෙම මහඟු ගුණාංගය අප බාල වියේදී ලබන සමාජානුයෝජනය මගින් මෙන්ම අප කියවන හා උගන්නා දෙයින් ද අප තුළ වර්ධනය කරගත හැකිය. විශේෂයෙන්ම සාහිත්‍ය නිර්මාණ කාර්යයේදී ළමා සාහිත්‍ය රචකයන් සතුව මෙහිලා ඉමහත් වගකීමක් ඇත. එය මැනවින් අවබෝධ කරගත්, එදා සිටි සිංහල ළමා සාහිත්‍ය කරුවන් තම නිර්මාණ මගින් එම කාර්යය ඉටු කර ලන්නට
උත්සාහ ගත් අවස්ථා බොහෝය. දරුවන්ට නිසි සාහිත්‍ය කෘති නිමවන්නට පෙරමුණ ගත් කුමාරතුංග මුනිදාස මහතා ළමා සිතට යෝග්‍ය වන පරිද්දෙන් කෙටි පද්‍ය හා රචනා මගින් මෙන්ම පද්‍යයට නැගූ කෙටි පුවත් මගින් ද මෙම කාර්යය ඉටු කර ඇති බවට සාක්ෂි බොහෝය.

බාල දරුවන් උදෙසා මෙම ලේඛකයා රචනා කළ, 'ශික්ෂා මාර්ගය' පොත් පෙළෙහි අපට හමු වන එවන් නිර්මාණ, රැසකි. එහි පළමු වන පොතෙහි ඇතුළත්, 'වෙරි වූ මීයා' නම් කුඩා කවි පෙළ දරුවන්ට කථා රසය සමගම, උඩඟු වීමේ අයහපත් ප්‍රතිඵල පිළිබඳ උපදේශයක් ද දෙන්නකි.

"දවසක් රා ටිකක් - ලැබ බී මත් ව මීයෙක්
බළලා වී මතක් - මෙසේ කීයේ උඩඟු වදනක්
බළලකු ඉතින් මට - අසු වුණ හොතින් විගසට
කඩා උඟු දෙකකට - දමමි ඇදලා කහළ ගොඩකට
ළමයෙක් ඒ දෙසා - -හැඬී බළලකු විලසා
මීයා ඒ අසා - වසාගෙන ඇස් කීය මෙබසා
"පින් සිදු වෙයි අනේ - මගේ හාමුදුරුවනේ
මා නො මැරුව මැනේ - වඳිමි අත් දෙක තබා මුදුනේ"
තම තරම දැන ගෙන - නොපැවතුණ හොත් සැම තැන
මීයාට වූ මෙන - බියයි වන්නේ නොසිතු විලසින"
(ශික්ෂා මාර්ගය, පළමු වන පොත)

ළමා ලෝකයේදී අසන්නට, දකින්නට ලැබෙන සතුන් ඇසුරෙන්, එම සතුන්ගේ ස්වභාවය පිළිබඳව දරුවන් සතුව පවතින දැනුමෙන් ද ප්‍රයෝජන ගනිමින් කුමාරතුංග මහතා මෙම පැදි පෙළ තව දුරටත් විචිත්‍රවත් ලෙස නිර්මාණය කොට ඇත. තම නිවෙස්වල, සුරතලට ඇති දැඩි වන බළලා, නිවැසියන්ට කරදරයක් වන මීයාගේ සතුරෙක් බව ළමා වියේදී දරුවන්ට හඳුනාගන්නට ලැබෙයි. එම සතුන් දෙදෙනකු ඇසුරෙන් දරුවන්ගේ සිත් තුළ සුන්දර රංගනයක් ද මතු වී පෙනෙන පරිද්දෙන් මෙම ලේඛකයා කුඩා පැදි පහක් නිර්මාණය කොට ඇත්තේ අවසානයේදී දරුවාට හැඟෙන තරමටත් වඩා ලේඛකයාම ඉදිරියට එමින් අවවාදයක් ද දෙමිනි. හැම විටම අප කළ යුත්තේ අපගේ තරම, නැතහොත් අපට හැකි දේත් නොහැකි දේත්, යෝග්‍ය දේත් අයෝග්‍ය දේත් හඳුනාගෙන ඊට අනුකූලව ක්‍රියා කිරීමයි. වෙරි වී මත් වූ මීයා, සාමාන්‍යයෙන් තමා බළලකුගේ ගොදුරක් වන කුඩා සතකු බව අමතක කරමින් බළලා නසා දැමිය හැකි යයි පුරසාරම් දොඩයි. දරුවන්ගේ මනසට විසිතුරු චිත්‍රයක් ද මවමින් දරුවන්ගේ මුව'ගට නැංවෙන සිනාව ද සමග ඔවුන්ගේ මනසට ද දැනමුතු කමක් දීම මෙම ලේඛකයාගේ අභිප්‍රාය වී ඇත.
වැඩිහිටි වියට පත් වන විට යහගුණදම් ගැන මනා අවබෝධයක් ලැබීමට සුදුසු වන සේ ළමා සිතට හොඳ පදනමක් දැමීම මෙවන් ශ්‍රේෂ්ඨ ලේඛකයන් අතින් සිදු වී තිබීම වැදගත්ය. මෙම ලේඛකයා විසින්ම නිර්මිත 'සිරිමත්' නමැති කවි පෙළ ද එදා දරුවන් අතර ජනප්‍රිය වූවකි. වර්තමාන පාසල් පද්ධතිය තුළ එවන් නිර්මාණ යොදා ගනිමින් දරුවන්ට යහගුණ උගන්වන්නට යොමු වීම තරමක් අඩු වී ඇති බව පෙනෙන නමුත් හැකි සෑම අවස්ථාවකදීම මෙවන් අගනා උපදෙස් මගින් ළමා මනස පෝෂණය කළ හැකි නම් අනාගතයේදී ඔවුන්ම 'අයහපත් උඩඟුකම' හැර දමා 'යහපත් නිහතමානීකමට' යොමු වනු ඇත.

"සිරිමත් මගෙ සකි - යහපත් ළමයෙකි
නුවණත් ඇත්තෙකි - වැඩටත් සමතෙකි

මව් පිය සහ ගුරු - නෑදෑ සොහොවුරු
සැමටම කීකරු - සැපතෙකි මේ දරු"
(ශික්ෂා මාර්ගය, පළමුවන පොත)

දරුවකු තුළ කීකරු කම ඇති කරවීමට එකල සමාජයේ වැඩිහිටියන් දැරූ උත්සාහය ළමා සාහිත්‍ය කරුවන්ගේ නිර්මාණ මගින් තවදුරටත් ඉස්මතු කරනු ලැබීය. උක්ත පැදි දෙකෙන් ගම්‍ය වන, සිරිමත් නම් යහපත් ළමයා මව්පියන්ට, ගුරුවරුන්ට, නෑදෑ සොහොයුරු ආදී සැමට කීකරු දරුවෙකි. එවන් දරුවකු පවුලට මෙන්ම මුළු මහත් සමාජයටම යහපතකි, සැපතකි යන අදහස මෙලෙසින් ළමා පද්‍ය රචනයකින් ගෙන හැර දැක්වීමේදී බාල විය තුළ නිසි සමාජානුයෝජනය ලැබීමට දරුවෝ සමත් වෙති.
අනාගතයේ වැඩිහිටියන් බවට පත් වන ඔවුන් එම කීකරු කම අවශ්‍ය විටදී, අදාළ පුද්ගලයන් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම මගින් ඔවුන් තුළ නිරායාසයෙන්ම නිහතමානී කම නමැති ගුණාංගය වගා වනු ඇත.

"පාට සුවඳ එක වගේ - තිබෙන රෝසමල වගේ
කීකරු පොඩි දරුවගේ - කවුරුත් පවසති අගේ"
වැනි ළමා කවිවලින් ද දරුවන් තුළ කීකරු කම ඇති කරන්නට එදා ලේඛකයන් උත්සාහ ගත්තේ ඔවුන් තුළ නිහතමානී කම නමැති ගුණය වගා කරවීමට පූර්ව සූදානමක් වශයෙනි.
එකල සමාජයේ පැවති සාමූහිකත්වය, වර්තමාන සමාජය වෙතින් ශීඝ්‍රයෙන් ගිලිහී යමින් පවතින බව සැබෑවකි. තාක්‍ෂණික වටපිටාවක හැදෙන වැඩෙන දරුවන් නිවසේ පසු වන කාලය තුළ ද සිය කාමරය තුළට වී පරිගණකය මෙහෙයවින් තමාටම සීමා වූ ලෝකයක දිවි ගෙවන බව දැනගන්නට ඇත. මෑතකදී ඉංග්‍රීසි පුවත් පතක පළවූ කාටූනයකින් මෙම තත්වය සමාජයට කියාපෑමක් සිදු විය. එහි දැක්වුණ පරිදි නිවසේ පහත මාලයේ මේසය මත වූ පරිගණකයෙන් පියා තම පුත්‍රයාට කෙටි පණිවුඩයක් යවමින් සිටියි. ඔහුගේ බිරිඳ ද ඔහු පිටුපසින් සිටගෙන පරිගණකය දෙසට එබිකම් කරගෙන සිටින ආකාරය එහි දක්වා තිබුණි. පියා තම පුතුට යවන කෙටි පණිවුඩයෙහි සඳහන් වූයේ මෙසේය. "පුතේ, ඔයා හොඳින්ද? අම්මාත් මමත් හොඳින්. ඔය පරිගණකය ක්‍රියා විරහිත කොට, අම්මාත් මාත් සමග කෑම කන්නට පහළට එන්න." එකම නිවෙස් ජීවත් වන දෙමාපියන් හා දරුවන් වෙන් වෙන්ව තම කටයුතුවල යෙදී සිටින අතර, එකට ආහාර ගැනීමට එන ලෙස දැන්විය යුත්තේ ද ඔවුන් එල්ලී සිටින තාක්‍ෂණික මෙවලම, නැතහොත් පරිගණකය මගිනි. මෙවන් සමාජ පරිසරයක දරුවන්ට යහගුණ කියා දෙන්නට හෝ නිහතමානී බව නමැති වටිනා සාරධර්මය හුරු කරවන්නට හෝ දෙමාපියන්ට පවා ලැබෙන අවකාශය, මද බව පැහැදිලි කරුණකි.

'සිරිත් මල්දම' නමැති පැරණි සිංහල කෘතිය දරුවන්ට යහගුණ කියා දෙන්නට ලියවුණකි. අද සමාජයේ සිදු වී ඇති මෙවන් ව්‍යසනයන් කල් තබාම දුටුවා සේ එහි රචනා වී ඇති අගනා කවක් පහත දැක්වෙයි.

"තම නිවසට පැමිණි
- සැම දෙන හටම කුලුණෙනි
කතා බස් කරමිනි
- අසන් තොරතුරු සුදුසු විදියෙනි"
(සිරිත් මල් දම)

වර්තමාන පවුල්වල දෙමාපියන්, දරුවන්ගේ අමතර පන්ති නිසා ඔවුන් සමග එකතු වී නෑ මිතුරන් හමු වීමට යාමට පවා නොහැකි තත්වයකට මුහුණ දී සිටින අයුරු දැකගත හැකිය. එපමණක් නොව, තම නිවසට ඥාති මිත්‍රාදීන්ගෙන් කිසිවකු පැමිණි විට ද ඔවුන් සමග සුහද කතාවකට එක් වන්නට තරම් විවේකයක් නොමැති දරුවෝ සිටිති. "සිරිත් මල් දම" කවියා මෙවන් තත්වයකට පිළියමක් ලෙස දරුවනට දෙන අවවාදයක් හැටියට උක්ත කව මගින් යහගුණයක් පිළිබඳව කියා ඇත. සමාජයක් තුළ යහපත් ඇසුරක්, හිත මිත්‍ර බවක් සමග එකමුතු කමක් ද උද්ගත වීම සඳහා තම නිවසට පැමිණෙන නෑ මිතුරන් හෝ වෙනත් ආගන්තුකයන් සමග සුහද කතාබස් සිදු විය යුතු බව දරුවන්ට කියා දීමට එදාටත් වඩා අද අවශ්‍ය වන්නේ එබැවිනි.

සමාජයක් තුළ ජීවත් වන සෑම කෙනෙක්ම අන් අයගේ ජීවිතවල වටිනාකම හඳුනාගත යුතුයි. අද ලෝකය පුරාම රටවල් තුළ මෙන්ම රටවල් අතර ද දරුණු ගැටුම් ඇති වන්නේ උක්ත යහපත් මානසික තත්වය ලෝකයා වෙතින් ශීඝ්‍රයෙන් ගිලිහී යමින් පවතින බැවිනි. න්‍යායාත්මක වශයෙන් මානව හිමිකම් ගැන කතා කරන ඇතැමුන් තම ක්‍රියාවන්හිදී ඊට හාත්පසින් වෙනස් ලෙස හැසිරෙන අයුරු දැකගත හැකිය. ඒ අනුව ගුණදම් වගාව, එහි